Voice of the
PRISONERS



# මානව හිමිකම් කොමිසමෙන් බන්ධනාගාරයට දැඩි විවේචනයක්..

බන්ධනාගාර නිලධාරීන් විසින් එම පරිශ්‍ර පරීක්ෂා කිරීම වැලැක්වීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිසම බන්ධනාගාර දෙපාර්තමේන්තුවට සිය දැඩි කනස්සල්ල හා විරෝධය පළ කර තිබේ.තවද බන්ධනාගාරගත රැඳවියන්ට සිදු වූ බව කියන වධහිංසා හා මරණ සම්බන්ධයෙන් ක්‍රියාත්මක විමර්ශනවලට පූර්ණ සහාය දෙන ලෙස ද එම කොමිසම බන්ධනාගාර ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ට නියෝග කර ඇත.

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිසම මෙම නිර්දේශ සිදුකර ඇත්තේ කොමිසමේ සභාපති විනිසුරු එල්.ටී.බී දෙහිදෙණිය ඇතුළු සාමාජිකයන් හමුවට බන්ධනාගාර නිලධාරීන් කැඳවා කළ සාකච්ඡාවකදීය.

මීගමු බන්ධනාගාර සිදුවීමෙන් පසු මානව හිමිකම් කොමිසමේ විමර්ශන නිලධාරීන් පසුගිය 7 වැනිදා වැලිකඩ බන්ධනාගාර පරීක්ෂාවකට ගොස් තිබූ නමුත් බන්ධනාගාර නිලධාරීන් විසින් එයට ඉඩ දෙනු නොලැබීය.මෙය පැහැදිලිවම පූර්ව දැනුම් දීමකින් තොරව ඕනෑම අවස්ථාවක රැඳවුම් භාරයේ පසුවන ස්ථාන වෙත ඇතුළුවීමට මානව හිමිකම් කොමිසමට ඇති බලය බන්ධනාගාර නිලධාරීන් විසින් උල්ලංඝනය කරනු ලැබීමක් බව එම කොමිසම බන්ධනාගාර නිලධාරීන්ට අවධාරණය කර ඇත.

බන්ධනාගාරය තුළ වූ අස්ථාවර තත්ත්වය නිසා මෙවැනි සිදුවීමක් වූ නමුත් එය නිසි ලෙස සන්නිවේදනය කිරීමට අපොහොසත්වී යැයි ද ඒ ගැන කනගාටුව පළකරන්නේ යැයි ද පවසා ඇති බන්ධනාගාර නිලධාරීහු මෙවැන්නක් නැවත නොවන බවට සහතික වන්නේ යැයි ද පවසා තිබේ.

කෙසේ වෙතත් එහිදී මීගමුව බන්ධනාගාරයේ සිදු වූ ප්‍රචණ්ඩකාරී සිදුවීම්වලින් පසු එහි රැඳවියන් වෙනත් බන්ධනාගාරවලට යොමුකිරීමේදී වධහිංසාවලට ලක්කිරීම ඇතුළු කාරණා රැසක් සම්බන්ධයෙන් මානව හිමිකම් කොමිසම බන්ධනාගාර නිලධාරීන්ගෙන් ප්‍රශ්න කර ඇත.

තවද රැඳවුම් භාරයන් පරීක්ෂා කිරීමට ඉඩ සැලැසීම, රැඳවියන්ගෙන් පලිග ැනීම වැලැක්වීම, රැඳවුම් ස්ථාන ගැන පවුල්වල උදවියට දැනුවත් කිරීම හා නියමිත දඬුවම් කාලය අවසන් කළ රැඳවියන් වහා නිදහස් කිරීම යන නිර්දේශ එහිදී මානව හිමිකම් කොමිසම විසින් බන්ධනාගාර නිලධාරීන්ට සිදුකරනු ලැබ ඇත.

**පවන් දයාරත්න**.

> **“ සමාජයක ශිෂ්ටාචාරයේ මට්ටම විනිශ්චය කළ හැක්කේ එම සමාජයේ සිරගෙවල්වලට ඇතුළු වී බැලීමෙනි.”**
>
> **- ඇමරිකානු බන්ධනාගාර ප්‍රතිසංස්කරණ පුවත් ලිපි 1960 .-**



# ඇසින් දුටු සාක්ෂි රකිනු..

මීගමුව බන්ධනාගාරයේ සිදු වූ මනුෂ්‍ය මරණ ශ්‍රී ලංකාවේ බන්ධනාගාර ඉතිහාසයට තවත් තද කළු පැල්ලමක් එකතු කර හමාරය. සිදුවූයේ කුමක්දැයි දැනගැනීමට දේශීය මෙන්ම ජාත්‍යන්තර වශයෙන් ද ඇත්තේ විසල් උනන්දුවකි. එහෙත් එය කළ හැක්කේ අපක්ෂපාතී, විධිමත් සහ විශ්වාසනීය විමර්ශනයකින් පමණකි.

අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව අධිකරණයට පසුගියදා දැනුම්දුන්නේ බන්ධනාගාර නිලධාරීන් සහ රැඳවියන් ඇතුළු පුද්ගලයන් 287 දෙනෙකුගෙන් ප්‍රකාශ සටහන් කරගෙන ඇති බවයි. එසේම ගැටුම සිදුවූ අවස්ථාවේ මීගමුව බන්ධනාගාරයේ සිටි සියලු රැඳවියන්ගෙන් ද වෙන වෙනම ප්‍රකාශ ලබාගැනීමට අපේක්ෂා කරන බවයි. සැබැවින්ම එය විමර්ශනයේ සම්පූර්ණත්වය සඳහා වැදගත් පියවරකි.

එහෙත්, ගැටුමෙන් පසු රැඳවියන් විවිධ බන්ධනාගාර වෙත මාරු කර තිබීමත් ඔවුන්ගෙන් ඇතැමෙකු පිළිබඳ තොරතුරු තමන්ට නොමැති බවට ඥාතීන් පැවැසීම බරපතල තත්ත්වයකි. මන්දයත් මෙසේ මාරු කළ බව කියන රැඳවියෝ වනාහි මෙකී ඛේදවාචකයේ ඇසින් දුටු සාක්ෂිකරුවන් වන බැවිනි. ඒ අනුව ඇසින් දුටු සාක්ෂිකරුවන් වෙත ප්‍රවේශ වීම ප්‍රමාද වුවහොත් හෝ අපහසු වුවහොත්, එය විමර්ශනයේ කාර්යක්ෂමතාව පිළිබඳ ප්‍රශ්න මතු කිරීම නොවැලැක්විය හැකිය.

ඇත්ත වශයෙන්ම අපරාධ විමර්ශනයකදී සාක්ෂිකරුවන්ගේ ආරක්ෂාව, ඔවුන්ට නිදහසේ ප්‍රකාශ ලබාදීමේ අවස්ථාව සහ විමර්ශන නිලධාරීන්ට ඔවුන් වෙත පහසුවෙන් ප්‍රවේශ විය හැකි පරිසරයක් සහතික කිරීම නීතියේ ආධිපත්‍යයට අත්‍යවශ්‍ය අංගයකි. එනිසා විවිධ ස්ථානවල රඳවා තබා සිටින සාක්ෂිකරුවන්ගේ යහපැවැත්ම ද විමර්ශනයේ තීරණාත්මක කරුණකි. එම ක්‍රියාවලිය සම්පූර්ණයෙන්ම විනිවිදභාවයෙන් සහ අධිකරණ අධීක්ෂණය යටතේ සිදු කිරීමට පහසුකම් සැලසීම බලධාරීන්ගේ වගකීමය.

# "කුඩුකාරයා කියා නිහඬ වෙන්නෙපා"



**"උං පාතාලයා කුඩුකාරයා කියා නිහඬවෙන්න එපා. මක්නිසාද? ඕගොල්ලන්ට ඇහෙන්නේ පොලිස් මාධ්‍ය ප්‍රකාශක හෝ කවුරු හෝ ඇමැතිවරයෙක් කියන දෙයක්. උසාවියක නඩු අහලා වැරැදිකාරයා වෙලා නොවෙයි. ඔහු වැරැදිකරුවකු ලෙස හඳුන්වන්නේ කොහොමද? ඒ නිසා සාමාන්‍යකරණය වීම වලක්වන්න මැදිහත්වීමට සාමාන්‍ය ජනතාවටත් විශාල වගකීමක් තිබෙනවා. සෑම පුද්ගලයෙක්ම එකම නීතියට යටත් විය යුතුමයි."**

*(204.01.31 : නීතිඥ හර්ෂණ නානායක්කාර ජාතික ජනබලවේගයේ නීතිඥයෝ සංවිධානයේ මාධ්‍ය හමුවකදී )*

# සිරගෙවල්වලට සැප කුමට ද?

බන්ධනාගාරගත කරන අයවලුන්ට පහසුකම් ලබා නොදිය යුතුය වැනි අදහසක් බහුතර ජනයා අතර පැතිර තිබේ. අපේ රටේ දණ්ඩන ක්‍රමය සතු බන්ධනාගාර බොහොමයක් අවීචි මහා නරකාදි ලෙසින් පවත්වාගෙන යති. එයට හේතු ගණනාවක් ඇතත්, ප්‍රධාන වශයෙන් මේ සිරකරුවන් අයිතිවාසිකම් රහිත දුක් විඳගෙන සිටිය යුතු පිරිසක් යන කරුණ රටේ මුල් බැසගෙන ඇති බැවින් තත්වය වඩා නරක් වන්නට මෙය හේතු වෙයි.

අධිකරණයකින් දණ්ඩනයක් ලද පසු, එයට වඩා දණ්ඩන ලබා දීම යුක්තිසහගත නොවේ. වසර කිහිපයකට බන්ධනගාරගත කිරීම යනු වසර කිහිපයකට ඔහුගේ නිදහස අහිමි කිරීම මිස නොපනවන ලද දණ්ඩනවලට යටත් කිරීම නොවේ.

පුනරුත්ථාපනය කිරීමත් දණ්ඩනයේ වැදගත්ම අංගයකි. දණ්ඩනය විඳීමෙන් පසු නැවත අපරාධවලට යොමු වීමේ ප්‍රතිශතය බටහිර රටවල පවා බොහෝ විට 50%ක් ඉක්මවන තත්වයක් යටතේ පුනරුත්ථාපනයේ වැදගත්කම ඉස්මතු වේ.

යම්කිසි අපරාධයක් කළ අයෙකු තවත් අපරාධවලට පෙළඹවීමෙන් වැළැක්වීම පිණිස මෙම සිරගත ජීවිතය සෑහෙන වැදගත්කමක් දරයි.

ලොව සුඛෝපභෝගීම බන්ධනාගාර ලෙස සැලකෙන්නේ නෝර්වේ රාජ්‍යයේ තිබෙන බන්ධනාගාරයි. එයිනුත් ලොව වඩාත් කතාබහට ලක් වන්නේ හෝල්ඩන් බන්ධනාගාරයයි. සෑම සිර මැදිරියකම, පැතලි තිර රූපවාහිනියක්, ඇටෑච් බාත්රූම්, ශීතකරණයක්, මේසයක් සහ වනාන්තරය පෙනෙන ලෙස ජනේලයක් ඇතුළත් වේ. එසේ ම පොදු විවේකාගාරයේ මනරම් සෝෆා සහ මුළුතැන්ගෙයි පහසුකම් ය. වරක් ඒවා දුටු බී.බී.සී. ජනමාධ්‍යවේදියෙකු විමසුවේ, එහි "සුවපහසුව වැඩි නැති ද?" යනුවෙනි.

එහිදී බන්ධනාගාර නිලධාරියා දුන් පිළිතුර එරට සමස්ත බන්ධනාගාර යාන්ත්‍රණය සම්බන්ධයෙන් වන හකුළුවා කීමක් වැනි ය.

"ඔබේ නිදහස අහිමි වීම ලෙහෙසි දෙයක් නෙවෙයි, ඔහු ස්ථිරසාර ලෙස පිළිතුරු දුන්නේ ය.නෝර්වේ රාජ්‍යයේදී දඬුවම කියන්නේ කෙනෙකුගේ නිදහස අහිමි කිරීම පමණයි. අනිත් අයිතිවාසිකම් එලෙසම පවතිනවා. සිරකරුවන්ට ඡන්දය දෙන්න පුළුවන්, ඔවුන්ට අධ්‍යාපනය හදාරන්න, සෞඛ්‍ය සේවා ලබා ගන්න පුළුවන්; ඔවුන්ට ඕනෑම නෝර්වීජියානු පුරවැසියෙකුට ඇති අයිතිවාසිකම්ම තියෙනවා. මොකද සිරකරුවොත් මිනිස්සු. ඔවුන් වැරදි කරලා තියෙනවා, ඔවුන්ට දඬුවම් කළ යුතුයි, නමුත් ඔවුන් තවමත් මිනිස්සු."

මෙහි අනෙක් වැදගත් කරුණ නම්, හෝල්ඩන් බන්ධනාගාරයේ නැවත පැමිණීමේ ප්‍රතිශතය 20% එනම් ලෝකයේ අඩුම ප්‍රතිශතය වීමයි. එහෙත් රැඳවියන් නැවත අපරාධවලට පෙළඹීමේ එම ප්‍රතිශතය දළ වශයෙන් අපේ රටේ 65%කි. මෙරට බන්ධනාගාරවල රැඳවූවන්ගෙන් 74%ක් පමණ සැකකරුවන් වෙද්දී නෝර්වේහි බන්ධනාගාරවල සිටින්නේ සිරදඬුවම් නියම වූවන් පමණි.

නෝර්වේ දණ්ඩන ක්‍රමය සහ ශ්‍රී ලංකාවේ දණ්ඩන ක්‍රමය සමතලයේ ගෙන සාකච්ඡා කිරීමට වඩා අපට මෙහිදී අවශ්‍ය වන්නේ, එවැනි රටවල් මිනිසුන් දණ්ඩනයෙන් නිවැරදි කරන්නට දැඩිව උත්සාහ ගන්නා විට, ශ්‍රී ලංකාව මිනිසුන් රඳවා ගන්නට දැඩි අරගලයක නිරතව සිටින බව පෙන්වා දෙන්නටයි.





# නිශ්ශබ්දව සිටීම ප්‍රතිපත්තියක් වූ තැන

## මීගමුව බන්ධනාගාරයේ රැඳවියන් අතුරුදහන් වීම පිටුපස ඇති ව්‍යුහාත්මක අසාර්ථකත්වය !

මීගමුව බන්ධනාගාරයේ ඇතිවූ කලබලකාරී තත්වයෙන් දින 23කට පසුවද, රාජ්‍යයේ නීත්‍යානුකූල භාරකාරත්වයේ සිටි රැඳවියන් පිරිසක් තවමත් කොහි සිටින්නේ දැයි සොයාගත නොහැකිවී තිබේ. එම රැඳවියන්ගේ පවුල්වලට ඔවුන් ජීවතුන් අතරද එසේ නැත්නම් මියගොස්ද යන්න පිළිබඳව නිල වශයෙන් කිසිදු තොරතුරක් ලැබී නැත. මෙය පරිපාලනමය ප්‍රමාදයක් නොව සිතා මතා සිදුකරන නොසලකා හැරීමකි. එය රැඳවුම් ක්‍රියාවලියට මිනිසුන් අමතක කර දැමීම කෙතරම් පහසුවෙන් කළ හැකිද යන්නත්, රාජ්‍යය ඒ සඳහා කෙතරම් කැමැත්තකින් ඉඩ දෙනවාද යන්නත් හෙළිකරන ව්‍යුහාත්මක අසාර්ථකත්වයකි.

මීගමුව බන්ධනාගාර සිදුවීමට පසු රජය ප්‍රකාශ කළේ මීගමුවේ සිටි රැඳවියන් දිවයින පුරා විවිධ බන්ධනාගාරවලට මාරුකර යැවූ බවත් පිරිසක් මීගමුව බන්ධනාගාරයේ සිටින බවත්ය. එහෙත් මීගමුවේ සිටි සිට පවුලේ සාමාජිකයා කොහිදැයි නොදන්නා බොහෝ පිරිසක් තවමත් වේ.

2018 අංක 05 දරන බලහත්කාරයෙන් අතුරුදහන් කිරීමෙන් සියලු පුද්ගලයන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාත්‍යන්තර සම්මුතිය පනත, එවැනි අතුරුදහන් කිරීම් වැළැක්වීම සඳහාම සකසන ලද්දකි. එහි 15(4) වගන්තිය අනුව බලධාරීන් සියලුම නිදහස අහිමි කරන ලද පුද්ගලයන් පිළිබඳව නිවැරදි වූත් යාවත්කාලීන වූත් ලේඛන පවත්වාගත යුතුය. අනන්‍යතාව, රැඳවුම් ස්ථානය හා කාලය, සෞඛ්‍ය තත්ත්වය, මාරු කිරීම් සහ සහ මරණය සිදුවුවහොත් එහි තත්ත්වයන් හා දේහයේ ගෙනයන ස්ථානය පිළිබඳව හෙළිකළ යුතුය. එහෙත් මීගමුව බන්ධනාගාර සිදුවීමේදී එම තත්වය අසම්පූර්ණයෙන්ම හෝ හිතාමතාම අවහිර කර ඇත.

මීගමුව බන්ධනාගාරය, මීගමුව රෝහල හා අනෙකුත් රැඳවුම් ස්ථානද  සෑම මාරුවීම් ලැයිස්තුවක්ම පරීක්ෂා කළ පවුල්වලට මේ අතුරුදහන් වූ පුද්ගලයන් පිළිබඳව තොරතුරක් නොවීය. දුරකතන ඇමතුම් වලට ලැබුණේ පරස්පර හෝ වංක පිළිතුරු පමණි. මීගමුව බන්ධනාගාරයේ රඳවා සිටින බව කියන රැඳවියන් බොහෝ දෙනෙක් මේ ලිපිය ලියන මොහොත දක්වා පවුල් වල සාමාජිකයන් දැක නැත. මෙය පනතේ 15(1) වගන්තියෙන් පැහැදිලිව තහනම් කරන රහස්‍ය රැඳවුම ශ්‍රී ලංකාවේ බන්ධනාගාර පද්ධතිය තුළ සිදුවන ආකාරයයි.

පනතේ 16(1) වගන්තිය අනුව නිදහස අහිමි කරන ලද පුද්ගලයෙකුගේ ඕනෑම ඥාතියෙකුට, නියෝජිතයෙකුට හෝ නීතිඥයෙකුට නිදහස අහිමි කරන ලද පුද්ගලයා සිටින ස්ථානය පිළිබඳ තොරතුරු වෙත ප්‍රවේශ වීමේ අයිතිය, තවත් ස්ථානයකට මාරු කිරීමේදී මාරු කළ ස්ථානය, මාරුකිරීම පිළිබඳව වගකිවයුතු බලධාරියා, නිදහස අහිමි කරන ලද පුද්ගලයාගේ සෞඛ්‍ය තත්ත්වය පිළිබඳ තොරතුරු, මරණය සිදු වුවහොත් මරණයේ අවස්ථානුගත කරුණු සහ මරණයට හේතුව සහ දේහයේ ගමනාන්තය දැන ගැනීමේ අයිතියක් ඇත.

15(4) වගන්තිය පවසන්නේ නීතිය ක්‍රියාත්මක කරන බලධාරීන් නිදහස අහිමි කරන ලද පුද්ගලයන්ගේ යාවත්කාලීන නිල ලේඛන හෝ වාර්තා සම්පාදනය කර නඩත්තු කළ යුතු අතර ඒවායේ පුද්ගලයාගේ අනන්‍යතාවය; නිදහස අහිමි කිරීමේ ස්ථානය, නිදහස අහිමි කිරීමේ ස්ථානයට ඇතුළු වූ දිනය හා වේලාව සහ නිදහස අහිමි කිරීමේ ස්ථානයට වගකිවයුතු බලධාරියා; නිදහස අහිමි කරන ලද පුද්ගලයාගේ සෞඛ්‍ය තත්ත්වය පිළිබඳ තොරතුරු; නිදහස අහිමි කිරීම අතරතුර මරණය සිදු වුවහොත් මරණයේ අවස්ථා සහ හේතුව සහ දේහයේ ගමනාන්තය; නිදහස් කිරීමේ හෝ වෙනත් නිදහස අහිමි කිරීමේ ස්ථානයකට මාරු කිරීමේ දිනය හා වේලාව, පුද්ගලයා මාරු කරන නිදහස අහිමි කිරීමේ ස්ථානයේ ගමනාන්තය සහ මාරු කිරීමට වගකිවයුතු බලධාරියා අඩංගු විය යුතු බවය

14(3 සහ 4) වගන්ති පවසන්නේ පුද්ගලයෙකු බලහත්කාරයෙන් අතුරුදහන් කිරීමේ වරදකට ලක්ව ඇතැයි විශ්වාස කිරීමට සාධාරණ හේතු ඇති විට, නිල පැමිණිල්ලක් නොමැති වුවද නීතිය ක්‍රියාත්මක කරන බලධාරීන් විමර්ශනයක් කළ යුතු අතර අතුරුදහන් වූ පුද්ගලයා සොයා ගැනීමට සියලු සුදුසු පියවර ගත යුතු අතර, රහසිගතව රඳවා සිටී නම් එම පුද්ගලයා නිදහස් කර ගැනීමටත්, මරණය සිදු වුවහොත් දේහය සොයා ගැනීමට, ගෞරවයෙන් සලකා ආපසු ලබා දීමටත් කටයුතු කළ යුතු බවයි.

අතුරුදන් වී ඇති බවට සැලකෙන රැඳවියන් 2026 ජුලි 5 වැනිදා ප්‍රචණ්ඩත්වය ආරම්භ වීමට පෙර මීගමුව බන්ධනාගාරයේ භාරයේ සිටි බව තහවුරු කර ඇත. ඔවුන්ගේ පවුල් සහ නීති නියෝජිතයන් නීතිඥවරුන් හා නීතීඥවරියන් විසින් නැවත නැවතත් විමසීම් කළද, ඔවුන්ගේ වත්මන් ස්ථානය, තත්ත්වය හෝ ඉරණම පිළිබඳ නිල පිළිගැනීමක් නොමැත. මාරු කිරීම් අතරතුර හෝ පසුව මරණ සිදු වී ඇති බවට විශ්වාසනීය වාර්තා ඇති අතර, රැඳවියන්ට වධහිංසා පැමිණවීම සහ අයහපත් සැලකීම පිළිබඳ බරපතල චෝදනා ද ඇත.

ඊටත් වඩා නරක දෙයක් වන්නේ විමර්ශනයක් නොමැති වීමයි, නිශ්ශබ්දව සිටීමයි. 14 වගන්තියට අනුව බලහත්කාරයෙන් අතුරුදහන් වීමක් සිදුවී ඇතැයි විශ්වාස කිරීමට සාධාරණ හේතු ඇති විට විධිමත් පැමිණිල්ලක් නොමැතිව පවා නීතිය ක්‍රියාත්මක කරන බලධාරීන් විමර්ශනයක් ආරම්භ කළ යුතු අතර, එම පුද්ගලයා හෝ දේහය සොයා ගැනීමට හා අවශ්‍ය නම් නැවත ලබා ගැනීමට කටයුතු කළ යුතුය. එවැනි විමර්ශනයක් ප්‍රකාශයට පත් කර නැත. මාරුවීම් හා වෛද්‍ය ප්‍රතිකාර පිළිබඳ වාර්තා ආරක්ෂා වී නැත. සාක්ෂිකරුවන් හා පවුල් තවමත් අනාරක්ෂිතව සිටිති. අවදානම ගැන දැන සිටි හෝ දැන සිටිය යුතුව තිබූ හා ක්‍රියා නොකළ උසස් නිලධාරීන් එම පනතේම උසස් වගකීම් විධිවිධාන යටතට අයත් වේ. ඔවුන්ගේ නිශ්ශබ්දතාව නොසැලකිල්ලක් නොවේ; එය ආයතනික උදාසීනත්වයකි.

මේ අතුරුදහන් වීම් තනි පුද්ගල අකටයුතුකම්වලට වඩා වැඩි යමක් හෙළි කරයි. ඒවා ප්‍රචණ්ඩත්වයෙන් පසුවත් මිනිසුන් අතුරුදහන් කළ හැකි රැඳවුම් පද්ධතියක් හා ඔවුන් ගැන වගවීමට වගකීමක් නොපෙන්වන දේශපාලන සංස්කෘතියක් හෙළි කරයි. නීතිය කුමක් කීවද අඛණ්ඩ නිශ්ශබ්දතාව පෙන්නුම් කරන්නේ ඒ පුරවැසියා වෙනුවෙන් ඒ නීති ක්‍රියාත්මක කිරීමට කැමැත්තක් නොමැති පාලන තන්ත්‍රයේ නිරුවතයි. එම කැමැත්ත බලෙන් ඇති වන තුරු, රාජ්‍යයේ භාරකාරත්වය අතුරුදහන් වීය හැකි ස්ථානයක් ලෙස පවතිනු ඇත.



# සිරකරුවකුගේ විලාපය

**වෙසෙන සඳ මේ පාළු ලෙන තුළ**
**නෙක් දිසා සිත පියාඹා යයි**
**නිබඳ සිතිවිලි සීන බියකරු**
**බූත වෙස් ගෙන පෙළයි මා නිති**
**(සිංහබාහු නාටකයෙන්)**

**දියසෙවෙල වෙලාගෙන කළු**
**ගැසුණු**
**ප්‍රාකාර**
**බලාගෙන හිඳියි දිවා**
**හතර වටින්**
**විහිදුවාගෙන ගිනිගෙන දැවෙන**
**රස්නය**
**දවන්නට ද මා**
**දවා පලහාගෙන බුදින්නට ද**
**ආධ්‍යාත්මය මගේ**

**කලාතුරකිනුයි වැස්සක් වැටෙන්නේ**
**එහෙත් ඒ මැදට පැන**
**හඬ දෙවන**
**මේ ගැජුම්**
**වෙර දරයි දෙදරවන්නට**
**සිතේ වීරිය බලය**

**“යථින්දඛීලො පඨවිංසිතො සියා**
**චතුබ්බි වාතෙහි අසම්පකම්පියො”**

**සතර දිගින් එන සුළඟට මැදි වී**
**පුර දොර නැග සිටි ඉන්ද්‍රඛීලයට**
**නොතැවී නොසැලී සදා සිටින්නට**
**සිතට දිරිය කොයි ලෙසින් ලබන්න ද**
**සිතට දිරිය දෙන මං ඇහිරෙන කල**

සම්මානිත මහාචාර්ය ජයදේව උයන්ගොඩ රචනා කළ “මම් කෙසේ පවසම්” කාව්‍ය සංග්‍රහය පසුගියදා නව මුද්‍රණයේ කොළඹදී එළිදැක්විණි. ජනතා විමුක්ති පෙරමුණේ පළමු කැරැල්ලේදී අත්අඩංගුවට පත්ව මහ නඩුවේ 3 වැනි විත්තිකරුව අවිවු ලබා 1973-1976 සිරගෙයි සිට ලියූ කවි එකතුවක් මෙහි සංග්‍රහ කර ඇත. තරුණ සිරකරුවකු සිරඅඩස්සියට පත්වීමෙන් පසු ඇතිවන හුදෙකලාව, තනිකම හා ප්‍රේමය මෙන්ම පිය විප්පයෝගය හා සමාජ දේශපාලන කරුණු ඔස්සේ මෙම කවි රචනා වී තිබේ. ඉහත දැක්වෙන්නේ එම කාව්‍ය සංග්‍රහයයේ සිරකරුවකුගේ විලාපය මැයෙන් වූ කාව්‍යයෙන් උපුටාගත් කොටසකි

---

# “ජාත්‍යන්තරය ඉදිරියේ අපි නිරුවත් වෙලා ඉවරයි!”



*සිරකරු අයිතිවාසිකම් සුරැකීමේ කමිටුවේ විධායක නිලධාරී නීතිඥ සේනක පෙරේරා*

**මීගමු බන්ධනාගාරයේ සිදුවුණ ඛේදජනක සිදුවීමට අදාළ නවතම තත්වය මොකක්ද?**

මෙම සිදුවීමෙන් පස්සෙ ආණ්ඩුව ඒකපාර්ශ්වික කරුණු දැක්වීමක් කළා රැඳවියන් වැරදි කියලා. මුළු ලෝකෙම දැක්කා අර විවෘත වෙඩි තැබීම. දණ්ඩ නීති සංග්‍රහයේ 294/4 යටතේ මිනීමැරීමට අදාළ වගකීම ඒ තැනැත්තට බාරගන්න වෙනවා. මේ ගැන අධිකරණයට කරුණු වාර්තා කරද්දි කිසිම සඳහනක් නෑ. නිලධාරීන්ගේ මරණ විතරමයි සඳහන් වෙන්නෙ. අධිකරණයට කරුණු ඉදිරිපත් වෙන්නෙත් අසමබරව. ඇමැතිවරයා ගියෙ නිලධාරීන්ගෙ මළගෙදර පමණයි. ඔහු භයානක ප්‍රතිඥාවක් දෙනවා අපරාධ නීතිය නවත්වන්නම් කියලා. මේ ගැටුමට පස්සෙත් රැඳවියන් තළා පෙළා දාන්න ලොකු ආශිර්වාදයක් රජයෙන් දුන්නා.

අපේ පැමිණිල්ලකට වැලිකඩ බන්ධනාගාරයට ඇතුළු වෙන්න ගිය මානව හිමිකම් නිලධාරීන් ඉතිහාසයෙ කවදාවත් නැති විදිහට එළවලා දානවා. රැඳවියන්ව ඥාතීන්ට බලන්න දෙන්නෑ. නීතිඥවරයක් ගියාට පෞද්ගලිකව කතා කරන්න දෙන්නෑ. ඇප දුන්නට එළියට දාන්නෑ කියලා කතාවකුත් තියනවා. තොරතුරු එළියට දෙන්නෑ තවදුරටත්.

**ධාරිතාව ඉක්මවන ලෙස රැඳවියන් තියන සිරගෙවල්වල පුරවනවා, මේක වෙනස් කරන්න කළ යුතු දේවල් මොනවද?**

බන්ධනාගාරවල ධාරිතාවට වඩා කිහිප ගුණයක් රඳවලා. මුලින්ම 65% ක් පමණ ඉන්න මත්ද්‍රව්‍ය රැඳවියන් ගැන අවධානය යොමු කළ යුතුයි. ඇප ගන්න පුළුවන් ප්‍රතිපාදන හදන්න ඕන. 54 වගන්තියෙ තියන ඇප ගන්න බැරි තද ප්‍රතිපත්ති ලිහිල් කළ සංශෝධනයක් ගේන්න ඕන. 2007 අංක 54 දරන ඖෂධවලට ඇබ්බැහි වූ තැනැත්තන් (ප්‍රතිකාර හා පුනරුත්ථාපනය) පිළිබඳ පනත යටතේ මේ මත් ඇබ්බැහිවූවන්ට ක්‍රියා කරන්න අවශ්‍යයි. ඔවුන්ට ලබා දිය යුත්තේ වෛද්‍ය ප්‍රතිකාර .වයස 70ට වැඩි රැඳවියන් නිදහස් කිරීම ගැන සලකා බැලීම කරන්න ඕන.

**රටක් විදිහට ජාත්‍යන්තරයට හමුවට ගියාම මේ සිදුවෙලා තියන දේවල් අපට මොන විදිහට බලපෑම් කරයිද?**

ආණ්ඩුව ඉන්නෙ මේකටත් අපි උත්තර දුන්නා කියන ස්වයංතෘප්ත මානසිකත්වයකින්. ඒත් ජාත්‍යන්තරය ඉදිරියේ අපි නිරුවත් වෙලා ඉවරයි. සිරකරුවන්ට සැලකීම ගැන එක්සත් ජාතීන්ගේ සංවිධානයේ සම්මුතිය - මැන්ඩෙලා නීති. ඒකට අත්සන් කරන රටවල් පොරොන්දු වෙනවා මේවා ගුරුකොට ගන්නවා කියලා. අපේ රටේ කරන්නෙ ඒකට පිටුපාලා වැඩ කරන එක. වධහිංසාවට එරෙහි පණතට අනුව කටයුතු කළ යුතුයි.

බන්ධනාගාර ප්‍රශ්නය කාල බෝම්බයක් වගේ. 2012 දි පිපුරුවා, 2020 දි පිපුරුවා. දැන් 2026 දී. මේ කාරණය සම්බන්ධයෙන් ලංකාවෙ බලධාරීන් කවදාවත් වග වුණේ නෑ. 2012 වැලිකඩ බන්ධනාගාරයේ 27ක් ජීවිත නැති වුණ වෙලාවෙ, නිමල් නම්බුවසම් නමැති කමිටු වාර්තාවක් ආවා. ඒකෙත් මේ තදබදය ගැන කියනවා. 2020 දි මහර බන්ධනාගාරයෙ සිදුවීමට අදාළ සරෝජනී කුසලා වාර්තාව. එහිත් තියනවා කළ යුතු දේවල්. මේ සියල්ල කඩදාසිවලට සීමා වෙලා, පාලකයන් දේශපාලන සංවාදවල ඉන්නවා. කතා කරන්නෙ මේවා ගැන නෙවෙයි, ජුලම්පිටියෙ අමරෙ ගැන. මේකෙ ගැඹුර අවබෝධ කරගෙන නෑ. ලංකාව ගැන ජාත්‍යන්තරයට යන්නෙ වගවීම නැති රාජ්‍යයක් විදිහට. ජී.එස්.පී සහන සහ ජාත්‍යන්තර ආර්ථික කාරණා, ආධාර වැඩසටහන්, ජාත්‍යන්තර ප්‍රතිරූපය වැටෙන දේවල් මේවා. අපි කොහොමත් එක්සත් ජාතීන්ගේ සංවිධානයට සැප්තැම්බරයේ මේ සිදුවීම් කියනවා.

**සිරකරු අයිතිවාසිකම් සුරැකීම උඩුගං බලා පිහිනීමක්. ජීවිත අවදානමක්. ඉන්නෙ ඉතා කුඩා කණ්ඩායමක්. තර්ජන නැද්ද?**

වැටුප් ප්‍රශ්න වලදි ආණ්ඩුව එක්කයි ගැටුම තියන්නෙ. නමුත් අපේ අරගලයෙදි ආණ්ඩුව විතරක් නෙවෙයි සමාජයෙ වෙනත් අගතිග ාමීව සිතන කණ්ඩායමක් එක්කත් ගැටෙන්න වෙනවා. මේ රටේ විපක්ෂ නායක යන්නෙත් නිලධාරියගෙ මළගෙදර පමණයි. වැඩ කරද්දි විශාල අභියෝග තියනවා. පසුගිය දින දෙකක නාඳුනන පුද්ගලයෙකු කාර්යාලයට ඇවිල්ලා තොරතුරු විමසලා තියනවා. මෙයට පෙරත් දුරකතන තර්ජන කළා. වැලිකඩ සිදුවීම අවස්ථාවේ නන්දිමාල්ගෙ නිවසට වෙඩි තැබුවා. බියවැද්දීම් තියනවා. දේශපාලන වුවමනාවන් හෝ නිලධාරීන්ගෙ පැත්තෙ ඉන්න අය වෙන්නත් පුළුවන්. මේක ජනප්‍රිය වැඩක් නෙවෙයි. ආණ්ඩුව ගහගෙන ඉන්නවා සිරකරුවෝද මනුෂ්‍යයෝය කියලා. සිරකරුවන් මනුෂ්‍යයන් කියලා ගහගෙන සිරකරුවන් වෙනුවෙන් වැඩ කරන අයට අමනුස්ස විදිහට සලකන්න බෑ.

---

**සංස්කරණය - සඳුන් ප්‍රියංකර විතානගේ**
**ප්‍රකාශනය - සිරකරු අයිතිවාසිකම් සුරැකීමේ කමිටුව**